# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2231/16 - 2021 ජුනි මස 11 වැනි සිකුරාදා - 2021.06.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය, 6 වන වගන්තිය සහ 14 වන වගන්තිය සමග කියවිය යුතු, 20 වන වගන්තිය යටතේ, මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මවිසින් පනවනු ලබන රෙගුලාසි.

මහින්ද රාජපක්ෂ,
මුදල් අමාත්‍ය.

2021 ජුනි මස 11 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

**රෙගුලාසි**

1. මෙම රෙගුලාසි "**2021 අංක 08 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි**" ලෙස හඳුන්වනු ලැබේ.

2. මෙම ගැසට් පත්‍රයේ නියමකර ඇති රෙගුලාසි අදාළ වන්නේ නෞභාර පත්‍රයේ/ ගුවන්භාර පත්‍රයේ දිනය ලෙස 2021 ජුනි මස 11 වැනි දින හෝ එදිනට පසු දිනක් සඳහන් වූ භාණ්ඩ ආනයනය කිරීම් සඳහා පමණි.

3. සංශෝධිත, විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසි පළ කරන ලද 2017 නොවැම්බර් මස 09 දිනැති අංක 2044/40 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* I වන උපලේඛනයට, පහත සඳහන් භාණ්ඩ සහ ඒවාට අනුරූපී සටහන් මෙයින් ඇතුළත් කරනු ලැබේ.

1A - PG 5466 — 495 (2021/06)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

| | I තීරුව සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය | II තීරුව සංයෝජිත වර්ගීකරණ සංකේතය | | III තීරුව විස්තරය | IV තීරුව ආනයන පාලන බලපත්‍රය (L) |
|---|---|---|---|---|---|
| **260** | **63.07** | | | ඇඳුම් මෝස්තර කැලි ඇතුළු අනෙකුත් සැකසූ භාණ්ඩ. | |
| | | 6307.90.00 | - | වෙනත් | |
| | | 6307.90.10 | -- | මුහුණු ආවරණ | L |
| | | | | | |
| **261** | **71.08** | | | සකස් නොකළ හෝ අඩ වශයෙන් නිෂ්පාදිත ස්වරූපවලින් යුත්, හෝ කුඩු ආකාරයෙන් වූ, රත්‍රං (ප්ලැටිනම් සමග ආලේපිත, රත්‍රං ඇතුළුව). | |
| | | | - | මූල්‍ය නොවන : | |
| | | 7108.11.00 | -- | කුඩු | L |
| | | 7108.12.00 | -- | අනෙකුත් සකස් නොකළ | L |
| | | 7108.13.00 | -- | අනෙකුත් අර්ධ වශයෙන් නිෂ්පාදිත ස්වරූපවලින් යුත් | L |
| | | | | | |
| **262** | **71.11** | 7111.00.00 | | අඩ වශයෙන් නිෂ්පාදනය කිරීම හැර ඊට අමතරව වැඩ නොදැමූ, ප්ලැටිනම්වලින් සැරසූ, නීච ලෝහ වර්ග, රිදී හෝ රත්‍රං. (ප්ලැටිනම්වලින් සැරසූ රත්‍රං පමණි) | L |
| | | | | | |

4. සංශෝධිත, විශේෂ ආනයනය හා අපනයන පාලන බලපත්‍ර ගාස්තු පළ කරන ලද 2016 පෙබරවාරි මස 11 දිනැති අංක 1953/28 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* I උපලේඛනයට, පහත සඳහන් අයිතම සඳහා ගෙවිය යුතු ආනයන පාලන බලපත්‍ර ගාස්තු මෙයින් ඇතුළත් කරනු ලැබේ.

| *අංකය* | *අයිතමය* | *ආනයනය පාලන බලපත්‍ර ගාස්තුව* |
|---|---|---|
| **63** | රත්‍රං | මි.ර.ගැ. වටිනාකමින් 0.4% |

5. සංශෝධිත, විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසි පළකරන ලද 2017 නොවැම්බර් 09 දිනැති අංක 2044/40 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* I වන උපලේඛනයෙන්, පහත සඳහන් භාණ්ඩ සහ ඒවාට අනුරූපී සටහන් මෙයින් ඉවත් කරනු ලැබේ.

| | I තීරුව සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය | II තීරුව සංයෝජිත වර්ගීකරණ සංකේතය | | III තීරුව විස්තරය | IV තීරුව ආනයන පාලන බලපත්‍රය (L) |
|---|---|---|---|---|---|
| **229** | **63.07** | | | ඇඳුම් මෝස්තර කැලි ඇතුළු අනෙකුත් සැකසූ භාණ්ඩ. | |
| | | 6307.90.00 | - | වෙනත් (මුහුණු ආවරණ පමණි) | **L** |

06 - 364

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.